

**තෝමස් එස්. මොන්සන්**
**සභාපතිතුමා විසිනි**

තෝමස් එස්. මොන්සන්
සභාපතිතුමා

# නත්තලේ ජීවය සොයාගැනීම

වසර ගණනාවකට පෙර, අසනීප ළමුන්ට ආශිර්වාදයක් දීම සඳහා අන් අය සමග සෝල්ට් ලේක් සිටි ආරෝග්‍යශාලාවට එන ලෙස තරුණ වැඩිහිටියෙක් ලෙස, මට කැඳවීමක් ලැබුනි. එහි ඇතුළුවූ විට, විදුලි බුබුළුවලින් ප්‍රභාමත් සහ ආලෝකමත්වූ නත්තල් ගසක් සහ ප්‍රවේශමෙන් ඔතන ලද ඇසුරුම් කිහිපයක් එම ගසේ විහිදුනු අතු පහල අපි දුටුවෙමු. අපි ඉන්පසුව කොරිඩෝරය දිගේ ගොස් අතක හෝ පාදයක වෙළුම් පටි සහිත කුඩා පිරිමි ළමුන් සහ ගැහැණු ලමුන් දුටු අතර, සමහරුන්ගේ ආබාධ සමහරවිට සුව කළ නොහැකි ඒවා විය. ඔවුහු අපව සිනහමුසු මුහුණින් යුතුව පිළිගත්හ.

දරුණු ලෙස අසනීපවූ, කුඩා බාල පිරිමි දරුවෙක්, මට කථා කළේය, "ඔබගේ නම කුමක්ද?"

මම මගේ නම ඔහුට කීවෙමි. ඔහු මෙසේ ඇසීය, "ඔබ මට ආශිර්වාදයක් දෙනවාද?"

ආශිර්වාදය ලබාදුන් අතර, අපි ඔහුගේ ඇඳ ළඟින් පිටව යන විට, ඔහු මෙසේ කීවේය, "ඔබට බොහොම ස්තුතියි."

අපි පඩි කිහිපයක් ගමන්කරන විට, ඔහු කථාකරන හඬ අපට ඇසින, "ඕ, මොන්සන් සොයුර, ඔබට ප්‍රීතිමත් නත්තලක් වේවා." ඉන්පසුව ඔහුගේ මුහුණේ විශාල සිනහවක් විහිදී ගියේය.

එම පිරිමි ලමයා තුල නත්තලේ ජීවය තිබින. නත්තලේ ජීවය යනු අපි හැම කෙනෙක්ගේම හදවතේ සහ ජීවිතවල තිබිය යුතු යමක් බව මම සිතමි, එය මෙම නත්තල් කාලයේ පමණක් නොව, වසර පුරාම තිබිය යුත්තකි.

අප තුල නත්තලේ ජීවය ඇති විට, වසරේ මේ කාලයේ අප සමරන, උන්වහන්සේගේ උපත අපට සිහිවේ: "මක්නිසාද ස්වාමීවූ ක්‍රිස්තුස් නම් ගැලවුම්කාරයෙක් නුඹලාට දාවිත්ගේ නුවර අද උපන්සේක." (ලූක් 2:11).

අපගේ කාලයේ නත්තල් කාලය සමරමින් ත්‍යාග දීමේ ආකල්පය විශාල කාර්‍යභාරයක් ඉටුකරයි. අපි අපගෙන්ම මෙසේ ඇසුවහොත් අපට ලැබෙන යහපත ගැන මම කල්පනාකරමි, වසරේ මෙම වටිනාම කාලයේ මා කුමන ත්‍යාගයක් ස්වාමීන්වහන්සේට සහ අන් අයට දීම උන්වහන්සේට අවශ්‍යවන්නේද?

අපගේ ස්වර්ගික පියාණන්වහන්සේ අප හැම කෙනෙකුගෙන්ම අපේක්ෂා කරන්නේ උන්වහන්සේට සහ පුත්‍රයාණන්ට කීකරුකම නම් දීමනාව බව මම යෝජනා කරමි. උන්වහන්සේ අපෙන් ඉල්ලන්නේ ආත්මාර්ථවීම, ලෝභකම හෝ කලහකාරී වීම නොව, පරාර්ථකාමී විම යයි මට හැඟේ. උන්වහන්සේගේ මාහැඟි පුත්‍රයාණන් මෝර්මන්ගේ පොතේ යෝජනාකරන ලෙසඃ

"මක්නිසාද සැබවින්ම සැබවින්ම මම නුඹලාට කියන්නෙමි, එනම් විවාදයේ ආත්මය ඇත්තා මා කෙරෙන් නොවන්නේය, එහෙත් යක්ෂයාගෙන් වන්නේය, … ඔහු එකෙක් අනෙකා සමග කෝපයෙන් විවාද වීමට මනුෂ්‍යයන්ගේ හදවත් කළඹන්නේය.

"බලව එකෙක් අනෙකා සමග කෝපයෙන් විරුද්ධවීමට මනුෂ්‍යයන්ගේ හදවත් කැළඹීම මෙය මාගේ ධර්මය නොවන්නේය; එහෙත් මෙය මාගේ ධර්මය වන්නේය, එනම් එවැනි දේවල් නැවැත්විය යුතු වන්නේය" (3 නෙපී 11:29–30).

මෙම විශ්මිත කාලවල පූර්ණත්ව කාලපරිච්ඡේදයේ, ප්‍රේමකිරීම සහ පරාර්ථකාමී වීමේ අපට ඇති අවස්ථා ඇත්තවශයෙන්ම අසීමිතය. නමුත් ඒවාද විනාශවෙන සුළුය. අද සතුටුකිරීමට හදවත්ද, කීමට කරුණාවන්ත වචනද, කළ යුතු ක්‍රියා සහ ගලවාගත යුතු ආත්මද ඇත.

නත්තලේ ජීවය ගැන තීක්ෂණ බුද්ධිමත් බවක් තිබූ එක් තැනැත්තෙක් මෙසේ ලීවේය:

*නත්තලේ ජීවය නම් මාය—*
*මම දුගී නිවසකට ඇතුල්වී, සුදුමැලි මුහුණින් යුතු ළමයින්ට විස්මිත සතුටකින් ඔවුන්ගේ ඇස් හොඳින් විවරකර, බැලීමට සැලැස්සුවෙමි,*
*මම මසුරාගේ මිටමෙලවූ අත් නිදහස්කර මෙසේ ඔහුගේ ආත්මයේ දීප්තිමත් ස්ථානයක් පාටකරගැනීමට සැලැස්සුවෙමි.*
*වයසක අයට ඔවුන්ගේ තරුණ කාලය අළුත්කිරීමට සහ පරණ කාලයේ සිටි අයුරින් සතුටින් සිහසීමට සලස්වමි.*
*මම චමත්කාරය ළමාවියේ සිටම හදවත්වල ජීවමානව තබමින්, නින්ද මැජික්වලින් බැඳුන සිහිනවලින් ප්‍රභාමත්කරමි.*
*මම බාස්කට්වලින් පිරුණ අඳුරු පඩිපෙලවල් නැගීමට උත්සුක පාදවලට සලස්වා ලෝකයේ යහපතින් හදවත් විස්මිතකර තබමි.*
*මම අකීකරු පුද්ගලයා ඔහුගේ චණ්ඩ නාස්තිකාර මාර්ගයේ මෙහොතකට නැවතීමට සලස්වා, උත්සුක අයට කුඩා සංකේතයකට ප්‍රේමකිරීමට යවන්නේ සතුටු කඳුළු වැගිරීමටය—එම කඳුළු වේදනාවේ දැඩි මාර්ග සෝදාහරින කඳුළුය.*
*මම අඳුරු සිර කූඩුවලට ඇතුල්වී, කැලැල් සහිත පුරුෂත්වයට සිදුවිය හැක්ක සිහිපත්කර, පැමිණීමට ඇති යහපත් දවස්වල ඉදිරිය පෙන්වමි.*
*මම නිසල වේදනාවේ සුදු නිවසට මෘදුව එමි, කථාකිරීමට නොහැකි බොහෝ දුර්වල තොල් නිශ්ෂබ්දව වෙව්ලා, කෘතඥව කථාකරයි.*
*දහස්ගණන් මාර්ගවලින්, මම වෙහෙසවූ ලෝකයාට දෙවියන්වහන්සේගේ මුහුණ බැලීමටද, තවද සුළු මොහොතකට කුඩා සහ අවාසනාවන්ත දේවල් අමතකකිරීමටද සලස්වන්නෙමි*
*නත්තල් ජීවය නම් මමය.*[1]

අප හැම කෙනෙක්ම නත්තලේ ජීවය, ක්‍රිස්තුස්වහන්සේගේ ජීවය—අළුතින් සොයාගනිත්වා.

**සටහන්**

1. E. C. Baird, "Christmas Spirit," James S. Hewitt තුලිනි, ප්‍රකා., *Illustrations Unlimited* (1988), 81.

---

### මෙම පණිවුඩයෙන් ඉගැන්වීම

ඔබ මොන්සන් සභාපතිතුමාගේ පණිවුඩය පවුලේ අය සමග බෙදාගන්නා විට, මෙම කාලයේදී අප කුමන ත්‍යාගයක් ස්වාමීන්වහන්සේට සහ අන් අයට දීම උන්වහන්සේට අවශ්‍යවන්නේද යන ප්‍රශ්නය අවධාරණයකිරීම ගැන සලකා බලන්න. අප හැම කෙනෙක්ම නත්තලේ ජීවය, "ක්‍රිස්තුස්වහන්සේගේ ජීවය—අළුතින් සොයාගන්නා අන්දම" ගැන පවුල් සාමාජිකයන්ගේ සිතිවිලි සහ අදහස් වාර්තාකිරීමට ඔවුන්ව දිරිගන්වන්න (නැතහොත්, කුඩා ළමුන්ට චිත්‍රයක් ඇඳීමට දෙන්න)

## තරුණ අය

### අංග සම්පූර්ණ නත්තල් සැඳෑව

**ජෙරී එස්. ජාකොබ්ස් විසිනි**

මා වැඩෙන විට, සෑම වසරකම තිබූ උසස්ම දෙය වූයේ නත්තල් සැඳෑවයි. මගේ පවුල සහ මම පිට්සා සැදුවෙම, කැරොල් ගියෙමු, සහ ඉන්පසුව නත්තල් මෙහෙය වෙනුවෙන් එකතුවූනෙමු. අපි ගීතිකා ගායනාකරමින්, අපම තෝරාගත් සංගීත භාණ්ඩ සමග කැරොල් ගීත ගායනා කළෙමු. පියා නිතරම නත්තල් සිතිවිල්ලකින් සැන්දෑව නිමකළ අතර, අපි සතුටින් කඳුළු සැලුවෙමු. නත්තල් සැන්දෑව තරම් ජීවිතයේ කිසිවක් ප්‍රියජනක නොවීය.

මා මදක් වයසින් වැඩිවන විට, මගේ මව කෙලී නම් අසල්වැසි ළමයෙක් බලාගත්තාය. කෙලී පාසල් ඇරී දිනපතාම අප නිවසට පැමිණියේ ඇගේ මව, පැටී සේවය කළ නිසාය. කෙලී නිතරම මා පසුපස බලු පැටියෙකු ලෙස ආවාය. පැටී ඇයගේ දියණිය රැගෙන අපගේ නිවසින් පිටව ගොස් මගේ නිවස සහ පවුලට සමාදානය ඇතිවූ විට එය විශාල සහනයක් විය.

එක් දෙසැම්බර් මාසයක, මව පැටී සහ කෙලීට නත්තල් සැඳෑවට අප සමග එක්වන ලෙස ආරාධනාකළ විට මම තැතිගත්තෙමි, *මගේ* නත්තල් සැඳෑවට, මව සිනහසී මට මෙසේ සහතික කළාය, "එයින් කිසිවක් වෙනස්වන්නේ නැත." නමුත් මම හොඳින් දැනසිටියෙමි. ඔවුන් අපගේ පිට්සා සියල්ලම අනුභවකරනු ඇත. කෙලී අප ගී කියන විට අපට විහිළුකරනු ඇත. මම ඉතාම නරක නත්තල් සැඳෑවකට සූදානම්වූනෙමි.

සැඳෑව පමිණිවිට, පැටී සහ කෙලී අප හා එක්වූ අතර, අපි කථාකරමින්, සහ සිනහසෙමින්, ගායනා කළෙමු. මගේ මව නිවැරදිය. එය හොඳින් තිබින. මධ්‍යම රාත්‍රියේ අපට ස්තුතිකළ ඔවුහු අකමැත්තෙන් වෙන්වූහ. මම සිත සතුටින් නින්දට ගියෙමි. නත්තලේ අවංක වටිනා ත්‍යාග බෙදාගන්නා විට අඩු නොවන බව මම දැනගත්තෙමි. ඒ වෙනුවට අපි ඒවා අන් අයට දෙන විට, ඒවා මිහිරිවී තවත් වැඩිවන්නේය.

© 2012 Intellectual Reserve, Inc. විසිනි. සියලු හිමිකම් ඇව්රිණි. ශ්‍රී ලංකාවේ මුද්‍රණයකරන ලදී. ඉංග්‍රීසි අනුමැතිය: 6/11. පරිවර්තන අනුමැතිය: 6/11. *First Presidency Message, December 2012* පරිවර්තනයයි. Sinhala. 10372 408

# බැහැදැක ඉගැන්වීම, ගැලවීමේ කාර්‍යයකි

*මෙ ලිපිය යාච්ඤාවෙන් අධ්‍යයනයකර, අදාල පරිදි, එය ඔබ බැහැදකින සොයුරියන් හා බෙදාගන්න. ඔබගේ සොහොයුරියන් ශක්තිමත් කිරීමට සහ සහන සමිතිය ඔබගේම ජීවිතයේ ක්‍රියාකාරී කොටසක් කරගැනීමට උපකාරවන්වන ප්‍රශ්න අසන්න.*

**ඇදහිල්ල, පවුල, සහනය**

බැහැදැක ඉගැන්වීම මගින් කාන්තාවන්ට පරීක්ෂාකාරීවීමට, ශක්තිමත්කිරීමට සහ එකිනෙකාට ඉගැන්වීමට අවස්ථාවක් ලබාදෙයි—එය සත්‍යලෙසම ගැලවීමේ කාර්‍යයකි. බැහැදැක ඉගැන්වීම තුලින්, සොහොයුරියෝ ගැලවුම්කරුවාණන් වෙනුවෙන් සේවයකර සදාකාලික ජීවනයේ ආශිර්වාද සඳහා සූදානම්වීමට කාන්තාවන්ට උපකාරකරති.

"'අනතුරු ඇඟවීම, පැහැදිළිකිරීම, අනුශාසනාකිරීම සහ ඉගැන්වීම, සහ ක්‍රිස්තුස්වහන්සේ වෙතට ඒමට [අන් අයට] අප අරාධනා කළ යුතුය' (ධීසහගී 20:59), මෙම එළිදරව්ව තුළින් ස්වාමීන්වහන්සේ ප්‍රකාශ කළසේක," යයි සභාපති ස්පෙන්සර් ඩබ්ලිව් කිම්බල් කීවේය (1895–1985). ඔහු මෙසේද කීවේය, "ඔබගේ සාක්ෂිය අති විශාල මාධ්‍යයකි."[1]

බැහැදකින ගුරුවරියන් ලෙස අපි ශුභාරංචි සත්‍යයන් ගැන අපගේ දැනුම වර්ධනයකරන විට, අපගේ සාක්ෂි ශක්තිමත්වී, බව්තීස්මවී ස්ථිරවීමට සූදනම්වන සොහොයුරියන්ට උදව්වන්නෙමු. අළුත් සාමාජිකාවන්ට සුභාරංචිය තුල නැංගුරමක්වීමට අපි උපකාර කරන්නෙමු. අපගේ බැහැදැකීම් සහ ප්‍රේමය මගින් "නොමගගිය අය ආපසු දිනාගැනීමට [සහ] සුභාරංචියෙන් සිසිල්වූ හදවත් උණුසුම් කිරීමට උපකාරවත් වන්නේය."[2] එසේම දේවමාළිගාවට සහභාගිවීම තුලින් ක්‍රිස්තුස්වහන්සේ වෙත ඒමට අපි සොහොයුරියන් දිරිගන්වන්නෙමු.

"ඔබ යන්නේ ආත්ම ගලවාගැනීමටය," සභාපති කිම්බල් බැහැදකින ගුරුවරියන්ට කීවේය, "අද බොහෝ කදිම ක්‍රියාකාරී අය සභාවේ ක්‍රියාකාරීව සිටින්නේ ඔබ ඔවුන්ගේ නිවාසවලට ගොස් ඔවුන්ට අළුත් දැක්මක්, අළුත් දර්ශනයක් දුන් නිසා යයි කිව නොහැක්කේ කාටද. ඔබ තිරය ඇද දමා ඇත. ඔබ ඔවුන්ගේ බුද්ධි සීමා දික්කර ඇත. …

"ඔබ ගලවාගන්නේ මෙම සොහොයුරියන් පමණක් නොව, නමුත් සමහරවිට ඔවුන්ගේ ස්වාමිපුරුෂයන් සහ ඔවුන්ගේ නිවාසද ගලවාගනියි."[3]

## ශුද්ධ ලියවිලිවලින්

දහම සහ ගිවිසුම 20:59; 84:106; 138:56

## අපගේ ඉතිහාසයෙන්

අනාගතවක්තෘ ජෝසප් ස්මිත් සහන සමිතිය සංවිධානයකළ විට, කාන්තාවන් දුප්පතුන් බලාගැනීම පමණක් නොව ආත්ම ගලවාගැනීමද කළ යුතු බව කීවේය. සභාවේ සිටින කාන්තාවන් ස්වර්ගික පියාණන්වහන්සේගේ ගැලවීමේ සැලැස්ම තුල අත්‍යාවශ්‍ය කාර්‍යභාරයක් ඉටුකරන බවද කීවේය.[4] අනාගතවක්තෘ ජෝසප් ස්මිත් ඉගැන්වූ මූලධර්මවල මගපෙන්වීම මගින්, සහන සමිතියේ සොහොයුරියන් ලෙස අපට, එකට වැඩකරමින්, කාන්තාවන් සහ ඔවුන්ගේ පවුල් දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨතම ආශිර්වාද සඳහා සූදානම්කළ හැකිය.

"අපි එකිනෙකා කෙරෙහි දයාව දක්වමු," යයි සභාපති බ්‍රිගම් යං කීවේය (1801–77), "තවද ශක්තිමත්ව [සිටින අය] දුර්වල අයට මුදු මොළොක් ලෙස සාත්තුකරත්වා, තවද පෙනීම ඇති අය අන්ධ අයට පාර සොයාගෙන යාමට හැකිවන තෙක් ඔවුන්ට මගපෙන්වත්වා"[5]

සටහන්

1. ස්පෙන්සර් ඩබ්ලිව් කිම්බල්, *Daughters in My Kingdom* තුලින්: *The History and Work of Relief Society* (2011), 116.
2. එලිෂා ආර්. ස්නෝ *Daughters in My Kingdom* තුලිනි, 83.
3. ස්පෙන්සර් ඩබ්ලිව් කිම්බල්, *Daughters in My Kingdom* තුලිනි, 117.
4. බලන්න ජෝසප් ස්මිත්, *Daughters in My Kingdom* තුල, 171–72.
5. බ්‍රිගම් යං, *Daughters in My Kingdom* තුලිනි, 107.

### මට කුමක් කළ හැකිද?

**1.** සදාකාලික ජීවනයේ ආශිර්වාද සඳහා සහන සමිතිය මාව සූදානම්කරන්නේ කෙසේද?

**2.** මා රැකබලාගන්නා අයගේ ඇදහිල්ල වැඩිකිරීමට මට කුමක් කළ හැකිද?

වැඩිදුර තොරතුරු සඳහා යන්න, reliefsociety.lds.org.

© 2012 Intellectual Reserve, Inc. විසිනි. සියලු හිමිකම් ඇවිරිණි. ශ්‍රී ලංකාවේ මුද්‍රණයකරන ලදී. ඉංග්‍රීසි අනුමැතිය: 6/11. පරිවර්තන අනුමැතිය: 6/11. *Visiting Teaching Message, December 2012* පරිවර්තනයයි. Sinhala. 10372 408